# The new Sri Lanka High Commissioner to the UK presents credentials to the Queen at Buckingham Palace

## නව මහකොමසාරිස්තුමා මහරැජිණට සාක්ෂිපත්‍ර ඉදිරිපත්කරයි

එක්සත් රාජධානියට පත්ව ආ නව ශ්‍රීලංකා මහකොමසාරිස්වරයා වන විනිසුරු නිහාල් ජයසිංහ මහතා විසින් ගිය මස 27 වෙනි දින උදයේ චාරිත්‍රානුකූලව බ්‍රිතාන්‍ය මහරැජිණට සාක්ෂිපත්‍ර ඉදිරිපත්කිරීම සිදු කරන ලදී. එම ගමනට ඒ මහතාගේ බිරිඳ වන ඉන්දිරා ජයසිංහ මහත්මිය ද වූවාය. ඒ යුවල බකිංහැම් මාළිගයට කැඳවා ගෙන යනලද්දේ මාළිගයෙන් පැමිණි අශ්ව කරත්ත දෙකකිනි. ජයසිංහ මහතා ක්‍රීම් පැහැති සිංහළ ජාතික ඇඳුමෙන් සැරසී සිටි අතර ජයසිංහ මහත්මිය සාරියකින් සැරසී සිටියාය. ජාතික ඇඳුමෙන් සැරසී එවැනි නිල කටයුත්තකට රැජිණ බැහැදකින්නට ගිය ප්‍රථම ලාංකිකයා ඔහු දැයි නොදනිමි.

මාළිගයේ සිට ආපසු ලන්ඩනයේ මහකොමසාරිස් කාර්යාලයට අශ්ව කරත්ත යෙන්ම ගෙනැවිත් ඇරලන ලදී. මහකොමසාරිස්වරයාට සුබපැතීමට ශ්‍රීලාංකිකයෝ පිරිසක් මහ කොමසාරිස් කාර්යාලයේ උත්සව ශාලාවට රැස්ව සිටියෝය. ඒ පිරිස ඇමතූ නව මහකොමසාරිස්වරයා බකිංහැම් මාළිගයට ගොස් මහ රැජිණ හමුවූ අවස්ථාව විස්තර කළේය. ඇය ඉතා කාරුණිකව ජයසිංහ යුවළගේ පවුලේ විස්තර ගැනද, ශ්‍රීලංකාවේ වර්තමාන තත්වය ගැනද විමසූ බව කීවේය. එසේම මහ රැජිණ 1954 දී ශ්‍රීලංකාවට ගිය සිය ප්‍රථම සංචාරය ගැනද එහි දී ඔවුන් හා කථාකර ඇත.

රැස්ව සිටි පිරිසට ශ්‍රීලංකා කෑමබීම වලින් නොඅඩුව සංග්‍රහ කෙරිණ. එය සුහදත්වය ප්‍රකාශ වුණු දිනයක් විය.



Sri Lanka High Commissioner Justice Nihal Jayasinghe presented his credentials to the Queen at the Buckingham palace. After the ceremony Mr Jayasinghe and Mrs Jayasinghe were brought to the London HC premises from the Palace in a horse-drawn open topped carriage.



Photo : Nimal Navaratne

## Civic Award for Rahula Thero of Letchworth Viharaya




The Civic Award from the Letchworth Garden City Council was bestowed upon **Ven. Nahalle Rahula Thero**, the Chief Incumbent of the **Letchworth Buddhist Viharaya**, in recognition of Thero's services to the religion and the communities in Hertfordshire. **The Mayor** of the City Council and the "Dayaka Sabha" of the Viharaya are in the picture with Rahula Thero.

# Mary, her suitcase and the stranger



**The Norwegian newspaper VG has reported a truly amazing story about a newly-wed trying to get to Norway to be with her husband, and the stranger who helped pay an unexpected luggage surcharge.**



**Stranger ආගන්තුකයා**

It was 1988, and Mary Andersen was in line at the Miami airport checking in for a long flight to Norway to be with her husband. When it was finally Mary's turn, she got the message that would crush her bubbling feeling of happiness.

" You'll have to pay a 103 dollar surcharge if you want to bring both those suitcases to Norway," the man behind the counter said.

Mary had no money. Her new husband had travelled ahead of her to Norway, and she had no one else to call.

" I was completely desperate and tried to think which of my things I could manage without. But I had already made such a careful selection of my most prized possessions," says Mary.

As tears streamed down her face, she heard a 'gentle and friendly voice' behind her saying, "That's okay, I'll pay for her."

Mary turned around to see a tall man whom she had never seen before. He had a gentle and kind voice that was still firm and decisive. " The first thing I thought was, Who is this man?"

Although this happened 20 years ago, Mary still remembers the authority that radiated from the man. He was nicely dressed, with brown leather shoes, a cotton shirt open at the throat and khaki pants, says Mary. She was thrilled to be able to bring both her suitcases to Norway and assured the stranger that he would get his money back. The man wrote his name and address on a piece of paper that he gave to Mary. She thanked him repeatedly. When she finally walked off towards the security checkpoint, he waved goodbye to her.

Who was the man?

**Barack Obama.**

Twenty years later, she is thrilled that the friendly stranger at the airport may be the next President and has voted for him already and donated 100 dollars to his campaign: " He was my knight in shining armor," says Mary, smiling.

She paid the 103 dollars back to Obama the day after she arrived in Norway. At that time he had just finished his job as a poorly paid community worker in Chicago, and had started his law studies at prestigious Harvard university.

Mary even convinced her parents to vote for him: In the spring of 2006 Mary's parents had heard that Obama was considering a run for president, but that he had still not decided. They chose to write a letter in which they told him that he would receive their votes. At the same time, they thanked Obama for helping their daughter 18 years earlier.

And Obama replied. In a letter to Mary's parents dated May 4th 2006 and stamped "United States Senate, Washington DC' Barack Obama writes:

'I want to thank you for the lovely things you wrote about me and for reminding me of what happened at Miami airport. I'm happy I could help back then, and I'm delighted to hear that your daughter is happy in Norway. Please send her my best wishes. Sincerely, Barack Obama, United States Senator '.

The parents sent the letter on to Mary.

Mary says that when her friends and associates talk about the election, especially when race relations is the heated subject, she relates the story of the kind man who helped out a stranger-in-need over twenty years ago, years before he had even thought about running for high office.

**UPDATE:** Also, remember this was 1988, when 100 dollars was quite a bit of money, compared to today's value.

# මේරි, සූට්කේසය සහ ආගන්තුකයා

**1988** දී මේරි ඇන්ඩර්සන් නම් අළුත විවාහ වූ තරුණිය නෝර්වේ වල සිටින සිය සැමියා වෙතට යාමට ඇමරිකාවේ මියාමි ගුවන්තොටුපළට ගියාය. බඩු කිරන කවුන්ටරයේ සිටි නිලධාරියා කීවේ ඇයගේ සූට්කේස් බර වැඩි නිසා එකක් පමණක් ගෙනයාමට දිය හැකි බවත්, අනෙක සඳහා ඩොලර් 103 ක් ගෙවිය යුතු බවත්ය. ඇයට කරකියාගන්නට දෙයක් නොවීය. මුදල්ද අතේ නැත. ඒ සූට්කේසය තුළ අවශ්‍ය දේ තිබුණු බැවින් එය විසිකර දමා යන්නටද නුපුළුවන. ඇය හීතියෙන් කුමක් කරන්නටදැයි සැලෙද්දී ඇයට පිටුපසින් පෝලිමේ සිටි කෙනෙකුගේ කට හඬක් ඇසිණ. " මම ගෙවන්නම් ඒ ගණන. ඒ සූට්කේස් එක එයාට ගෙනියන්න දෙන්න."

ඒ තරුණ කටහඬ කීය. මේරි පුදුමයෙන් ආපසු හැරී බලන විට දුටුවේ පිටුපසින් සිටි හොඳට ඇඳ පැළඳ ගත් කඩවසම් උස තරුණයෙකි. කවුද මේ හාදයා? මේරි සිතුවාය. මේ සිද්ධිය වී වසර 20 ක් ගතවූ නමුත් ඔහුගේ කටහඬේ ස්ථිර වගකීමක් සහිත බවක් ගැබ්වී තිබුණු බව ඇයට තවම මතකය. ඔහු ඇයට තුණ්ඩු කෑල්ලක තම ලිපිනය ලියා දුන්නාය. තරුණයාට බොහෝ වාරයක් ස්තුති කළ මේරි, නෝර්වේ ගිය ගමන් ඒ මුදල ආපසු එවන බවට පොරොන්දු වූවාය. සූට් කේස් දෙකම ගෙනයන්නට හැකිවීම ගැන ඇය සතුටු වූවාය. ඇය ඔහුට ආයුබෝවන් කියා තම ගුවන් යානයට නගින්නට ගියාය. ඈතට ගොස් ආපසු හැරී බලද්දී ඇය දුටුවේ අත වනා සුබ පතන ඒ ආගන්තුක තරුණයාය. ඇත්තට ඔහු කවුරුද? මේරි නෝර්වේ ගිය ගමන් තරුණයාගේ මුදල් ඔහුට යැවුවාය.

ඒ තරුණයා අන් කිසිවෙකු නොව බැරක් ඔබාමාය. ගිය සතියේ ඇමරිකාවේ ජනාධිපති ලෙස තේරී පත්වුණු ඔබාමාය. වසර 20 කට පෙර තමාට ගුවන් තොටුපලේදී විශාල උදව්වක් කළ කුළුපග තරුණයා ඇමරිකාවේ ජනාධිපති ලෙස තරඟ කරන බව දැනගත් ඇය ඔහුට ඡන්දය දුන්නා පමණක් නොව ඔහුගේ ව්‍යාපාරයට ඩොලර් 100 ක් ද පරිත්‍යාග කළාය. ඇය ඇමරිකාවේ වසන දෙමාපියන්ටද කීවේ කෙසේ හෝ ඔබාමා දිනවන්නට වැඩකරන ලෙසය. මේරිගේ මව ඔබාමා දිරිගන්වන ලිපියක් ඔහුට ලියා යවමින් තම දියණියට අවුරුදු 20 කට පෙර ඔහු කළ උපකාරයද මතක් කරදුන්නාය. ඔහු ඊට මේ පිළිතුර මේරිගේ මවට එවා තිබුණි.

" මා දිරිගන්වමින් ඔබ එවා තිබූ ලිපියට ද, එදා මයාමි ගුවන් තොටුපලේ වූ දේ මතකයට නැගීම ගැනද ඔබට ස්තුතියි. එදා ඔබේ දියණියට උදව්වක් කරන්නට මට හැකිවීම ගැන සතුටු වෙමි. ඇය නෝර්වේහි සතුටින් සිටින බව ඇසීම සතුටකි. ඇයට මා සුබ පැතූ බව කියන්න. ස්තුතියි! මෙයට හිතවත් බැරක් ඔබාමා. සෙනේට් සභික. "